// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2180/26 - 2020 ජූනි මස 17 වැනි බදාදා - 2020.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### (203 වැනි අධිකාරිය වූ) මෝටර් වාහන පනත

(203 වැනි අධිකාරිය වූ) මෝටර් වාහන පනතේ 237 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**මහින්ද අමරවීර,**
ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍ය.

2020 ජූනි මස 16 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2020 අංක 03 දරන මෝටර් වාහන (රියදුරු බලපත්‍ර වලංගු කාලය තාවකාලිකව දීර්ඝ කිරීමේ) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. මෝටර් වාහන පනත යටතේ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති,

(අ) 2020 මාර්තු මස 16 වැනි දින සිට 2020 ජූනි මස 30 වැනි දින දක්වා කාලය තුළ වලංගු කාලය අවසන් වන සෑම රියදුරු බලපත්‍රයකම වලංගු කාලය අදාළ රියදුරු බලපත්‍රයේ වලංගු කාලය අවසන් වන දින සිට මාස හයක (06) ක කාලයකින් දීර්ඝ කරනු ලැබේ.

(ආ) 2020 ජූලි මස 01 වැනි දින සිට 2020 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ වලංගු කාලය අවසන් වන සෑම රියදුරු බලපත්‍රයකම වලංගු කාලය අදාළ රියදුරු බලපත්‍රයේ වලංගු කාලය අවසන් වන දින සිට මාස තුනක (03) කාලයකින් දීර්ඝ කරනු ලැබේ.

3. 2020 මාර්තු මස 17 වැනි දින අංක 2167/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 2020 අංක 01 දරන මෝටර් වාහන (රියදුරු බලපත්‍ර වලංගු කාලය තාවකාලිකව දීර්ඝ කිරීමේ) නියෝග සහ 2020 මැයි මස 19 වැනි දින අංක 2176/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 2020 අංක 02 දරන මෝටර් වාහන (රියදුරු බලපත්‍ර වලංගු කාලය තාවකාලිකව දීර්ඝ කිරීමේ) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

07 - 128